052903
2015/07/23
ML/PR
D - 828

# උඩරට බලියාග සාහිත්‍යයේ කාව්‍ය ලක්ෂණ

STOCK VERIFICATION

| | |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නර්තන හා නාට්‍ය කලා පීඨයේ පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රය මගින් පවත්වනු ලබන ප්‍රාසංගික කලාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ස්වාධීන නිබන්ධය යි.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
පුස්තකාලය
වර්ග අංකය.............
ප්‍රවේශ අංකය....... 052903
දිනය.............

බී. ඒ. ඩී. සරත් ප්‍රේමරත්න
DD/MP/DA/08/029

2013

නර්තන හා නාට්‍ය කලා පීඨය
පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රය
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

052903

# සංඥාපනය

බලියාගය ශ්‍රී ලංකාවේ නර්තන සම්ප්‍රදායත්‍රය පුරා පැතිර පවත්නා වූ සුවිශේෂ ශාන්තිකර්මයකි. ග්‍රහ ශාන්තිකර්මයක් ලෙස ගොඩනැගී ඇති බලියාගයේ ඊට ආවේණික ලක්ෂණ සලකා සම්ප්‍රදායන් පහක් දැකගත හැකි වුව ද තත් ශාන්තිකර්මය එකම මූලයකින් ප්‍රභවය වී ඇති බව පිළිගැනීමයි. උඩරට නර්තන සම්ප්‍රදාය ඇසුරෙහි වැඩී ආ බලියාග සම්ප්‍රදාය, උඩරට බලියාගය නම් වේ.

පොදුවේ බලියාගය පිළිබඳ ප්‍රකාශිත පර්යේෂණ කෘති, ලේඛන, ලිපි ආදිය හමු වේ. එමගින් ප්‍රධාන සම්ප්‍රදායත්‍රයේ මෙන්ම ඌව සහ නුවර කලාවියේ බලියාග පිළිබඳව ද විවිධ පැතිකඩ ඔස්සේ අඩු වැඩි වශයෙන් විමර්ශනය කර ඇත. උඩරට බලියාගය පිළිබඳව සෘජුවම සම්බන්ධ වූ කෘති හතරක් හමු විය. ජේ. ඊ. සේදරමන් විසින් 1964 සහ 1967 යන වර්ෂයන්හි එළි දක්වන ලද සුභ ශාන්ති විධි නොහොත් ලංකාවේ බලි උපත හා බලියාග විචාරය නොහොත් ලංකාවේ බලි උපත යන කෘතිද්වය උඩරට බලියාගය ප්‍රධාන කොටගෙන සංගෘහීතය. මෙය උඩරට බලියාගය පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීම් සහිත තත් යාග සාහිත්‍යයේ භාවිත අෂ්ටක, ශ්ලෝක ඇතුළු සුවිශාල පද්‍ය සාහිත්‍ය එකතුවකින් සම්පාදිත ය. මනෝජ් පුෂ්පකුමාර ජිනදාස 2009 සහ 2010 යන වර්ෂයන්හි පළ කළ බලි ඇඹුම් කවි පොත 01 සහ 02 කාණ්ඩ මාතලේ ලැහැබ බලි පරපුරට අයත් ඇඹුම් කවි සංස්කරණයකි.

දේශීය ශාන්තිකර්ම සාහිත්‍යය ජන සාහිත්‍යයෙන් පෝෂණය වූ ගැමි කලාවක් සේ දැකීම සමාජයේ සාමාන්‍ය ලක්ෂණය යි. උඩරට බලි යාගයේ කාව්‍ය සාහිත්‍යය විමර්ශනය කර බැලීමේ දී ජන සාහිත්‍යයෙන් ඔබ්බට ගිය ලක්ෂණ ඇත්දැයි සොයා බැලීමට අපව පෙළඹවීය. බලියාග සාහිත්‍යය උක්ත කෘති මගින් එළි දැක්වුණ ද එහි අන්තර්ගත කාව්‍ය ලක්ෂණ පිළිබඳව ප්‍රාමාණික පර්යේෂණයක් මේ වන තෙක් සිදු කර නොමැත. එම තත්ත්වය යටතේ උඩරට බලියාග සාහිත්‍යය පිළිබඳව විමසා බැලීම සුදුසු බව අපගේ අදහස යි.

මෙම පර්යේෂණය මගින් උඩරට බලියාගයෙහි සියලු පැතිකඩ පිළිබඳව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු නොවේ. එහි කාව්‍ය සාහිත්‍යයේ විදග්ධ කාව්‍ය ලක්ෂණ සෙවීමේ අරමුණින් සිදුකරන ලද්දකි. එබැවින් උඩරට බලියාගය හා සම්බන්ධ කෘති, ලිපි එකතු ආදිය මෙම පර්යේෂණ කාර්යය සඳහා භාවිත කර ඇත. කෞතුකාගාර පුස්තකාලයෙන් හා බලි යාගාචාර්යවරුන් කිහිප දෙනෙකුගෙන් ලබාගත් බලියාග සාහිත්‍යය හා සම්බන්ධ පුස්කොළ පොත් කිහිපයක් ද මේ සඳහා යොදා ගැනින. එමෙන් ම ඔවුන් සතු අත්පිටපත් පරිශීලනයෙන් ද සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන් ද තොරතුරු එක් රැස් කරනු ලැබිණ.

මෙම නිබන්ධනයෙහි පළමු පරිච්ඡේදය පර්යේෂණ සැලැස්ම හා සාහිත්‍ය විමර්ශනයෙන් යුක්ත ය. එහි දී සාහිත්‍ය විමර්ශනය යටතේ බලියාගය පිළිබඳව හා කාව්‍ය සාහිත්‍යය පිළිබඳව පවතින සාහිත්‍ය විමසුමට ලක් කරනු ලැබ ඇත. දෙවන පරිච්ඡේදය යටතේ බලියාගය පිළිබඳව හා එය පැතිර පවත්නා ප්‍රදේශ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත්

කිරීමක් සිදු වේ. එමෙන් ම බලියාග සාහිත්‍යයේ ගද්‍ය, පද්‍ය, කාව්‍ය මොනවාද යන්න විවරණය කරනු ලබන අතර 'බලි' යන පදය පෙරදිග හා අපරදිග ව්‍යවහාර වී ඇති ආකාරය සහ අර්ථය පැහැදිලි කිරීමක් ද වේ. තෙවන පරිච්ඡේදයෙන් උඩරට බලියාග සාහිත්‍යයේ භාවිත ඡන්දස් හා විරිත් පිළිබඳව විමර්ශනය කළෙමු. එහි දී හෙළ ශාන්තිකර්ම සාහිත්‍යයේ ඇතැයි මෙතෙක් හඳුනා නොගත් සංස්කෘත ඡන්දස් හා විරිත් පිළිබඳව අවධානය යොමු වූවා සේ ම හෙළ ඡන්දස හා විරිත භාවිත කර ඇති අයුරු ද විමර්ශනය කෙරේ. සිව්වන පරිච්ඡේදය සකුවේ හා සිංහලයේ භාවිත කාව්‍යාලංකාර ප්‍රස්තුත යාග සාහිත්‍යයේ භාවිත වන්නේ කෙසේ ද යන්න සාකච්ඡා කරනු ලැබේ. තත් යාග සාහිත්‍යයේ පැනෙන අවශේෂ ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කිරීමක් පස්වන පරිච්ඡේදයෙහි ලා සිදු වේ.